විද්‍යුත් තැපෑල/වැදගත්

**එන්. කේ. ඉලංගකෝන් මහතා**

**පොලිස්පතිතුමා,**

ගරු පොලිස්පති තුමනි,

***මරණීය තර්ජන සම්බන්ධයෙන් 2010.01.29 දින කුරුඳුවත්ත පොලිස් ස්ථානයට සිදු කළ පැමිණිලි විමර්ශණය නොකිරීම සම්බන්ධයෙනි.***

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවය කරමින් සිටියදී 2010 ජනාධිපතිවරණයෙන් අනතුරුව මා සහ තවත් වැඩසටහන් නිෂ්පාදකවරුන් තිදෙනකුට එවකට රූපවාහිනී සංස්ථාවේ සභාපති/අධ්‍යක්ෂ ජෙනරාල් මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා විසින් මරණීය තර්ජන එල්ල කිරීම සම්බන්ධයෙන් 2010.01.28 දින කුරුඳුවත්ත පොලිසියට පැමිණිලි කිරීමට ගියද අපගේ පැමිණිලි භාර ගැනීම එවකට සිටි ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළේය.

ඊට පසු දින එනම් 2010.01.29 දින නැවත එහි ගිය අපගේ බලවත් ඉල්ලීම නිසා අපගේ ලිඛිත පැමිණිලි සුළු පැමිණිලි වශයෙන් භාර ගන්නා ලදුව පසුව සමථ මණ්ඩලයට යොමු කර තිබිණි. අප වෙත යුක්තිය සාධාරණය එමගින් හෝ ඉටු වනු ඇතැයි සිතා සමථ මණ්ඩලයට ගොස් දින ගණනක් රස්තියාදු වුවද අදාළ චූදිතයින් ඊටද සහභාගී නොවූ අතර කුරුඳුවත්ත පොලිසිය ඒ වෙනුවෙන් කිසිඳු ඉදිරි පියවරක් නොගත්තේය.

**එහෙයින් කරුණාකර පහත අංකයන් යටතේ වන අපගේ පැමිණිලි සුළු පැමිණිලි ලෙස නොව අපරාධ පැමිණිලි ලෙස සලකා විභාග කොට අප වෙත යුක්තිය ඉටු කරදෙන මෙන් අදාළ සිදුවීමට වසර 05 ක් ගතව තිබෙන අද දින ඔබගෙන් ඉල්ලා සිටිමු.**

1. MOIB 89/265 - කුමාර අලගියවන්න
2. MOIB 82/263 - රවී අබේවික්‍රම
3. MOIB 79/262 - කංචන මාරසිංහ
4. MOIB 86/264 - ගාමිණී පුෂ්පකුමාර

මේ සම්බන්ධයෙන් කඩිනම් අපක්ෂපාතී සාධාරණ පරීක්ෂණයක් සිදු කරතැයි උදක්ම අපේක්ෂා කර සිටිමු.

**ස්තූතියි**

**මෙයට – විශ්වාසී**

**කුමාර අලගියවන්න ( දුරකතනය – 0750 787 795 ඊමේල් kumara.alagiyawanna@gmail.com )**

**ලේඛක, ජනමාධ්‍යවේදී සහ රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂ**

**බඳුවත්ත, නාරංගස්පිටිය**

**කිරිඳිවැල**

**2015.01.26 දින**

පිටපත්

1. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
2. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා
3. ගරු ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා
4. කැඳවුම්කරු/ලේකම් – නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
5. සභාපති/ලේකම් - ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය